# ඉස්ලාම් ධර්මය

## ෂරීඅත්, තරීකත්, හකීකත්, මඃරිෆත්

## යන අයුරින් වෙන්

## කළ හැකිද?

සංස්කරණය

මහාචාර්ය අහ්මද් අෂ්රෆ්




بسم الله الرحمن الرحيم

بسم الله الرحمن الرحيم

සූෆිවාදීන් විසින් ඉස්ලාම් ධර්මය ෂරීඅත්, තරීකත්, හකීකත්. මඃරිෆත් යන අංග සතරකට බෙදා වෙන් කොට විවරණය කර ඇත.

### ෂරීඅත්

සලාතය ඉටු කිරීම, උපවාස රැකීම, හජ් ඉටු කිරීම යනාදී බාහිර වන්දනාමාන ක්‍රියාත්මක කිරීම.

### තරීකත්

ෂෙයික් වරයකු වෙත පැමිණ ඔහු වෙත ප්‍රතිඥා දී ඔහු යටතේ සිට ඇතැම් මෙනෙහි කිරීම් තෙපලා ආත්මික පුහුණුව ලබා ගැනීම.

### ඉස්ලාම්

### හකීකත්

ආත්මික පුහුණුව ලබා ගැනීම හරහා විශ්වයේ සියල්ල ඔහු වේ යන අද්වෛත චින්තනය ධාරණය කර ගැනීම.

### මඃරිෆත්

සමිඳාණන් ව සියලු ආකාරවලින් අවබෝධ කර ගැනීම.

එලෙස මඃරිෆා තත්ත්වය ලබා ඇති අයකු සඳහා පස්වේල් සලාතය අවශ්‍ය නොවන බවත් ඒ වෙනුවට දික්ර් නොහොත් මෙනෙහි කිරීම් ස්වල්පයක් තෙපලීම ප්‍රමාණවත් බවත් ඔවුන්ගෙන් ඇතැමුන් වාද කරති. මෙය අරාබි බසින් إسقاط التكاليف الشرعية ලෙස හැඳින්වේ. එනම් ආගමානුගත කරන ලද පැවරුම් නිෂ්ප්‍රභ කිරීමේ තත්ත්වය වේ.

තවද, හකීකත් සහ මඃරිෆත් යනු අල්ලාහ්ගේ රහස් බවත් නබි (ﷺ) තුමාණන් අලී (رضي الله عنه) තුමාණන් වෙත එම රහස් උගන්වා ඇති බවත් අලී (رضي الله عنه) තුමාණන් වෙතින් හසන් අල් බසරී තුමාණන් ඒවා ලබා ගත් බවත් සූෆිවරුන් වාද කරති. මේ සඳහා ඔවුන් ෂේක්වරුන්ගේ දම්වැලක් (සිල්සිලාවක්) ද සකස් කොට ඇත.

ඉස්ලාම් ධර්මය මෙවැනි අංග සතරකට බෙදා වෙන් කළ හැක යනුවෙන් අල්කුර්ආනයේ හෝ අල්හදීස් වල හෝ සඳහන්වී නැත. නබිමිතුරන් හෝ ඔවුනට පසු පැමිණි සමූහය විසින් හෝ එසේ ප්‍රකාශ කර නැත. ගුරු කුල නැතහොත් නිකාය ඉමාම්වරුන් වන අබූ හනීෆා, මාලික්, ෂාෆිඊ, අහ්මද් බින් හම්බල්

යන විද්වතුන් පවා එසේ ප්‍රකාශ කොට නැත. හදීස් ක්ෂේත්‍රයේ මුල්කාලීන විද්වතුන් වන ඉමාම් බුහාරි, මුස්ලිම්, අබූ දාවූද්, තිර්මිදි, නසාඊ, ඉබ්නු මාජා වැනි විද්වත්හු ද එසේ ප්‍රකාශ කර නැත. මෙවැනි මතවාද පසුකාලීන සූෆිවාදීන් විසින් ඇති කළා වූ බිද්අත් නොහොත් නවක කරුණු අතුරිනි.

ඉස්ලාම් ධර්මය මේ අයුරින් අංග සකරකට බෙදා වෙන් කිරීම ශිර්ක් නොහොත් සමානයන් උපකල්පනය කිරීමකි. මේ සඳහා සාක්ෂිසාධක පහත සඳහන් වේ.

## සාධක අංක 1

وَأَنَّ هَذَا صِرَاطِي مُسْتَقِيمًا فَاتَّبِعُوهُ وَلَا تَتَّبِعُوا السُّبُلَ فَتَفَرَّقَ بِكُمْ عَنْ
سَبِيلِهِ ذَلِكُمْ وَصَّاكُمْ بِهِ لَعَلَّكُمْ تَتَّقُونَ سورة الأنعام : 153

තවද නියත වශයෙන්ම මෙය මාගේ ඍජු මාර්ග යයි. එබැවින් නුඹලා එය අනුගමනය කරනු. (වෙනත්) මාර්ග අනුගමනය නොකරනු . එවිට නුඹලා ව ඔහුගේ මාර්ගයෙන් එය වෙන් කරනු ඇත. මෙමගින් ඔහු(අල්ලාහ්) නුඹලාට උපදෙස් දෙනුයේ නුඹලා බිය බැතිමත් විය හැකි වනු පිණිසය. (අල් අන්ආම් 153)

මෙම වැකිය ඉස්ලාමය එකම පැහැදිලි මාවත බවත්, තරීකත්, හකීකත් සහ මඃරිෆත් යන මාර්ග ඉස්ලාමයෙන් ඔබ්බට ගිය ඒවා බවත් පැහැදිලිව ම හඟවයි.

## සාධක අංක 2

ثُمَّ جَعَلْنَاكَ عَلَىٰ شَرِيعَةٍ مِّنَ الْأَمْرِ فَاتَّبِعْهَا وَلَا تَتَّبِعْ أَهْوَاءَ الَّذِينَ لَا يَعْلَمُونَ الجاثية: 18

පසු ව එම කරුණ තුළින් යම් පිළිවෙතක් මත අපි ඔබ ව පත් කළෙමු. එහෙයින් ඔබ එය අනුගමනය කරනු. තවද දැනුමකින් තොර සිටින්නන්ගේ ආශාවන් ඔබ අනුගමනය නොකරනු. (අල් ජාසියා 18)

මෙම වැකියෙන් ගම්‍ය වන්නේ ඉස්ලාමය ෂරීඅත් යන එක මාර්ගයකින් පමණක් සමන්විත බවත් අනෙක් ක්‍රමඋපාය හා මාර්ග මිනිසා විසින් සාදන ලද මායාවන් බවත් ය.

## සාධක අංක 3

أَمْ لَهُمْ شُرَكَاءُ شَرَعُوا لَهُمْ مِنَ الدِّينِ مَا لَمْ يَأْذَنْ بِهِ اللَّهُ    سورة الشورى :21

අල්ලාහ් කවර දෙයක් සම්බන්ධයෙන් අනුමැතිය නොදුන්නේ ද එවන් දෙයක් ඔවුන් සඳහා දහම්ගත කළ හවුල්කරුවෝ ඔවුනට වෙත් ද? (අෂ් ෂූරා 21)

අල්ලාහ් විසින් අනුමත නොකරන ලද තරීකත්, හකීකත් සහ මඃරිෆත් යන මාර්ග ඉස්ලාමයට නන්අයුරින් පනවන ලද කරුණු බව මෙම වැකිය හරහා පැහැදිලි වේ.

## සාධක අංක 4

يَا أَيُّهَا الرَّسُولُ بَلِّغْ مَا أُنْزِلَ إِلَيْكَ مِنْ رَبِّكَ وَإِنْ لَمْ تَفْعَلْ فَمَا بَلَّغْتَ رِسَالَتَهُ    المائدة :67

අහෝ! රසූල්වරය, නුඹගේ පරමාධිපති වෙතින් නුඹ වෙත පහළ කරනු ලැබූ දෑ දන්වා සිටින්න. තවද නුඹ එසේ නොකළේ නම් එවිට ඔහුගේ දූත මෙහෙවර නුඹ දැන්වූයේ නැත. (අල්මාඉදා 67)

නබි (ﷺ) තුමාණන් තමාවෙත පහළ වූ කිසිවක් සඟවා නොතිබූ බවත් ඉස්ලාමය තුළ කිසිදු රහසක් නොමැති බවත් මෙම පදය පැහැදිලි කරයි.

## සාධක අංක 5

عَنْ عَامِرِ بْنِ وَاثِلَةَ قَالَ: سَأَلَ رَجُلٌ عَلِيًّا: هَلْ كَانَ رَسُولُ اللَّهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ يُسِرُّ إِلَيْكَ بِشَيْءٍ دُونَ النَّاسِ؟ فَغَضِبَ عَلِيٌّ حَتَّى احْمَرَّ وَجْهُهُ وَقَالَ: مَا كَانَ يُسِرُّ إِلَيَّ شَيْئًا دُونَ النَّاسِ غَيْرَ أَنَّهُ حَدَّثَنِي بِأَرْبَعِ كَلِمَاتٍ، وَأَنَا وَهُوَ فِي الْبَيْتِ، فَقَالَ: «لَعَنَ اللَّهُ مَنْ لَعَنَ وَالِدَهُ، وَلَعَنَ اللَّهُ مَنْ ذَبَحَ لِغَيْرِ اللَّهِ، وَلَعَنَ اللَّهُ مَنْ آوَى مُحْدِثًا، وَلَعَنَ اللَّهُ مَنْ غَيَّرَ مَنَارَ الْأَرْضِ رواه مسلم: 5096 والنسائي: 4434 واللفظ له

මිනිසෙකු අලී (رضي الله عنه) තුමාණන් වෙත පැමිණ අන් අයට හෙළි නොකළ රහස් නබි (ﷺ) තුමාණන් ඔබට ප්‍රකාශ කර සිටියේ ද යනුවෙන් අසා සිටියහ. එවිට එතුමාණන් කෝපයට පත් විය. ඒ හේතුවෙන් එතුමාගේ මුහුණ රත් විය. පසුව එතුමා විසින් මෙසේ පවසන ලදීඃ අන් අයට හෙළි නොකළ රහස් කිසිවක් නබි (ﷺ) තුමාණන් මා හට ප්‍රකාශ නොකළේය. (මුස්ලිම් 5096/ නසාඊ 4434)

නබි (ﷺ) තුමාණන් රහසින් අලී (رضي الله عنه) තුමාණන් වෙත අද්වෛත ඥානය ඉගැන්වූ බවට සූෆිවරුන් විසින් ගොඩනගන තර්කය අසත්‍ය බව මෙයින් පෙනී යයි.

එමෙන් ම හසන් අල්බසරී තුමාණන් අලී (رضي الله عنه) තුමාණන් වෙතින් හදීස් කිසිවක් වාර්තා නොකළේය. එය ඓතිහාසිකව තහවුරු කරන ලද සත්‍යයකි යැයි (ජාමිඋත් තහ්සීල් ලිල් අලාඊ, පිටු අංකඃ 162) හි සඳහන් වේ.

මෙසේ තිබියදී හසන් අල්බසරී තුමාණන් අලී (رضي الله عنه) තුමාණන් වෙතින් අද්වෛත ඥානය,තරීකා ව හා දිව්‍යමය රහස් කෙසේ නම් ලබා ගත්තාද යන්න ප්‍රශ්නාර්ථයකි.

# සූෆිවරුන්ගේ වැරදි මත සහ ඒවාට පිළිතුරු

ඉස්ලාම් ධර්මය ෂරීඅත්, තරීකත්, හකීකත්. මඃරිෆත් යන අංග සතරකින් සමන්විත වේ යනුවෙන් තර්ක ගොඩනගන මොවුන් එම පුහු තර්ක සඳහා අල්කුර්ආන්, අල්හදීස් සහ ඇතැම් නබිම්තුරන්ගේ කියමන් සාක්ෂිසාධක ලෙස ඉදරිපත් කළ ද ඔවුන්ගේ තර්කයට පක්ෂ ව කිසිදු සාධකයක් හෝ අනුබලයක් එහි නොමැතැයි යන්න ප්‍රත්‍යක්ෂ කරුණකි.

ඔවුන් ඉදිරිපත් කරන මත සහ ඒවාට නිසි ප්‍රතිචාර අප විසින් පහත සඳහන් ආකාරයට පැහැදිලි කර ඇත්තෙමු.

## පළමු වැරදි මතයඃ

කහ්ෆ් පරිච්ඡේදයේ වාක්‍ය 60 සිට 82 දක්වා සඳහන් සිද්ධිය පදනම් කරගෙන සූෆීවරු පවසන්නේ මූසා යනු ෂරීආවෙහි නබිවරයා බවත් හිල්ර් හකීකත්හි වලීවරයා බවත්ය. පහත සඳහන් කරුණු කාරණා හේතු කොට ගෙන මෙම ප්‍රකාශය නිරවද්‍ය නොවන බව හැඟී යයි.

1. හිල්ර් (عليه السلام) වලීවරයකු නොවේ. ඔහු මූසා (عليه السلام) වැනි නබිවරයෙකි. මන්දයත් සිදුවීම අවසානයේ හිල්ර් (عليه السلام) විසින්ඃ

وَمَا فَعَلْتُهُ عَنْ أَمْرِي

"මම මාගේ කැමැත්ත පරිදි මෙය සිදු නොකළෙමි" යනුවෙන් ප්‍රකාශ කරන ලදී. එසේනම්, නැවේ සිදුරු දැමීම, දරුවකු මරා දැමීම,ගරා වැටෙන්නට යන බිත්තියක් කෙළින් කිරීම යනාදිය එතුමා විසින් සිදු කරනු ලැබුවේ අල්ලාහ්ගේ අණ පරිදි ය. එබැවින් එතුමා

නබිවරයකු බවට කිසිදු සැකයක් නැත. සූෆිවරුන් ඔවුන්ගේ තර්කය සාධාරණීකරණය කළේ ඔහු වලීවරයකු බව පවසමිනි. මුල්කාලීන විද්වතුන් එතුමා වලීවරයකු යැයි කීවේ නැත.

2. පුද්ගලයකු, මිනිසුන් අතුරින් මහා බුද්ධිමතා කවුරුන් ද යනුවෙන් මූසා (عليه السلام) ගෙන් විමසා සිටියේය. එවිට මා වෙමි යැයි මූසා (عليه السلام) විසින් පිළිතුරු දෙන ලදී. මෙම සිද්ධිය පාදක කර ගනිමින් එතුමාට වඩා බුද්ධිමය වශයෙන් උසස් අයකු වන හිල්ර් (عليه السلام) සමඟ මූසා (عليه السلام) හමුවීමට අල්ලාහ් සැලැසුම් කළේ මූසා (عليه السلام)ට පාඩමක් ඉගැන්වීම සඳහාය. (බුහාරිඃ 121, මුස්ලිම් 6133)

හකීකත්, මඃරිෆත් යන සංකල්ප අතරත් මොවුන් දෙදෙනාගේ හමුවීම අතරත් කිසිදු සබඳතාවක් නොමැත.

## දෙවන වැරදි මතයඃ

عن ابن مسعود رضي الله عنه قال: قال رسول الله صلى الله عليه وسلم: أنزل القرآن على سبعة أحرف، لكل آية منها ظهر وبطن (رواه ابن حبان: 75) والبغوى: 122 عن الحسن مرسلا

නබි (ﷺ) තුමාණන් පැවසූ බව ඉබ්නු මස්ඌද් (رضي الله عنه) තුමාණන් විසින් වාර්තා කරන ලදීඃ අල්කුර්ආනය ක්‍රම හතකින් පහළ කරන ලදී. එහි සෑම වාක්‍යයකම බාහිරයක් මෙන්ම අභ්‍යන්තරයක් ද ඇත. (මූලාශ්‍රයඃ ඉබ්නු හිබ්බාන් 75)

බාහිරය යනු ෂරීආව මෙන්ම අභ්‍යන්තරය යනු හකීකත් නම් සංකල්පයකි යනුවෙන් සූෆිවරුන් වාද කරති. පහත සඳහන් හේතු නිසා මෙම ප්‍රකාශය නිරවද්‍ය නොවන බව හැඟී යයි.

1. බාහිරය යනු අල්කුර්ආන් පාරායනය කිරීම සහ අභ්‍යන්තරය යනු එය අවබෝධ කිරීම වේ. මෙම හදීසය සඳහා සූෆුවරුන් විසින් ලබා දෙන අර්ථ විවරණය හුදු අනුමානයක් පමණි.

2. මෙය දුර්වල නබිවදනකි. මන්ද එහි වාර්තා සබැඳියෙහි සිටින අබූ ඉස්හාක් නැමැත්තා හමදානී ද නැතහොත් සබීඊයා ද යන්න පිළිබඳත් මෙය නබිතුමාගේ ම ප්‍රකාශයක් ද නැතහොත් ඉබ්නු මස්ඌද්තුමාගේ ප්‍රකාශයක් ද යන්න පිළිබඳත් නොයෙකුත් ආකාරයේ ප්‍රකාශ වාර්තා වී ඇත. මෙවැනි සංකල්ප හදීසයක් දුර්වල කරනු ඇත.

## තෙවන වැරදි මතයඃ

عن أبي هريرة رضي الله عنه قال : حفظت من رسول الله صلى الله عليه وسلم وعاءين فأما أحدهما فبثثه وأما الآخر فلو بثثه قطع هذا البلعوم. رواه البخاري : 119

මා නබිතුමාණන්ගෙන් බඳුන් දෙකක (නබිවදන්) ප්‍රමාණයක් ධාරණය කළෙමි. එයින් එක් බඳුන් ප්‍රමාණයක් මා ව්‍යාප්ත කළෙමි. අනෙක මා ව්‍යාප්ත කළේ නම් මාගේ ස්වරාලය කපා දමනු ලැබේ යනුවෙන් අබූ හුරෙයිරා (رضي الله عنه) තුමා විසින් වාර්තා කරන ලදී. (බුහාරි 119)

1. අබූ හුරෙයිරා (رضي الله عنه) තුමා විසින් ව්‍යාප්ත නොකළ කරුණු අද්වෛත ඥානය වේ යනුවෙන් සූෆිවරුන් විසින් වැරදි හා විකෘති අදහසක් ජනිත කර සමාජගත කරන ලදී. සැබෑව නම් අබූ හුරෙයිරා (رضي الله عنه) තුමා විසින් ව්‍යාප්ත නොකළ කරුණු යන්නෙන් අදහස් වන්නේ දුෂ්ඨ පාලකයින්ගේ නාමවලියයි. එම නාමාවලිය හෙළිදරව් කළේ නම් පාලකයින්

විසින් තමන් ඝාතනය කිරීමට ලක් වේ යන බිය හේතුවෙන් එම නාමවලිය හෙළිදරවු නොකර වසං කරන ලදී.

لو شئت أن أقول بني فلان وبني فلان لفعلت

මා අභිමත කළේ නම් (එම නාමාවලියේ අන්තර්ගත වන්නේ) මෙකී සමාජය, එකී සමාජය වේ යනුවෙන් නම්ගම් සමඟ විස්තර කරන්නට තිබුණි යනුවෙන් අබූ හුරෙයිරා (رضي الله عنه) තුමා විසින් වරක් ප්‍රකාශ කරන ලදී. (බුහාරි 6805)

2. සූෆිවරුන් එම ඥානය අබූ හුරෙයිරා (رضي الله عنه) තුමාගෙන් ලබා ගත් බව පිළි නොගනී. එහෙයින් එතුමාගේ කියමන සාක්ෂිසාධකයක් ලෙස ඔවුනට ලබා ගැනීමට නොහැක. එතුමා විසින් ව්‍යාප්ත නොකළ කරුණු අද්වෛත ඥානය වේ යන්න සූෆිවරුන් විසින් ම අනුමාන කරන ලද පුහු අදහසක් මිස වෙනකක් නොවේ.

## සිව්වන වැරදි මතය:

عن علي بن أبي طالب رضي الله عنه أنه قال: حدثوا الناس بما يعرفون أتحبون أن يكذّب الله ورسوله . رواه البخاري: 127

තේරුම් ගැනීමට හැකි කරුණු මිනිසුනට උගන්වන්න. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් බොරුබවට පත් කිරීම නුඹලා ප්‍රිය කරන්නේද යනුවෙන් අලී (رضي الله عنه) තුමා විසින් ප්‍රකාශ කරන ලදී. (බුහාරී 127)

මෙහි අද්වෛත ඥානය පිළිබඳ අලී (رضي الله عنه) තුමා සඳහන් කළ බව සූෆිවරුන් තර්කයක් ගොඩනගති. මෙම තර්කය නිරවද්‍ය නොවේ. මන්ද අලී (رضي الله عنه) තුමා විසින් මෙහි ප්‍රකාශ කරනු ලැබුවේ මිනිස් චින්තනයේ ගුණාත්මකභාවය විවිධාකාර බවත් සමහරුන්හට තේරුම් ගැනීමට හැකි දේ අනෙක් අයට තේරුම් ගැනීමට නොහැකි

බවත් ය. එබැවින් සවන්දෙන්නන්ගේ චින්තන ශක්තිය අනුව හදීසයක් පැවසිය යුතුයි යන්න අලී (رضي الله عنه) තුමාණන්ගේ අරමුණ විය.

නිදසුනක් වශයෙන් හදීස් අසන්නා ඒකාධිපති රජෙකු නම් ඔහු අබියසස කැරලිකරුවන් මරා දමන මෙන් අදහස් කරන හදීස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුතුයි. මෙයට හේතුව ඔහු කැරලිකරුවන්ට එරෙහිව අසීමිත බලය යෙදවීමට ඉඩකඩ ඇත යන්නයි.

එමෙන්ම තාර්කිකත්වයට පටහැනි දුර්වල හදීස් සහ සිදුවීම් ගැන ද ජනයාට කිව යුතු නොවේ. ඒ හේතුවෙන් ජනයා තුළ ඉස්ලාමය ගැන සැක පහළ විය හැක.

ඇතැම් හදීස් වල (අල් ෆිතන් නොහොත්) අර්බුදකාරී කාලවකවානුවකදී දුරස් ව සිටිය යුතු බව සඳහන් වේ. කුරිරු පාලකයන්ගේ කාලයේ මෙම හදීස් ජනයාට නොකියවිය යුතුයි. මන්ද ඒ නිසා අයුක්තියට එරෙහිව සටන් කිරීමට මහජනතාවට ධෛර්යය නැති වනු ඇත.

එපමණක්ද නොව සවන්දෙන්නන් පාපිෂ්ඨ වැරදිකාර අයවලුන් නම් ඔවුන් අබියස අල්ලාහ්ගේ දයාව හා සමාව දීමේ ගුණාංග ඇතුළත් හදීසයන් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුතුය. මන්ද අල්ලාහ් ඔවුන්ට සමාව දෙනු ඇතැයි සිතා ඔවුන් අඛණ්ඩව පාපිෂ්ඨ ක්‍රියාවල නිරත වනු ඇත.

පහත දැක්වෙන හදීස් මෙම ස්ථාවරයට පදනමක් ලෙස ගත හැක.

عن أنس رضي الله عنه قال: ذكر لي أن النبي صلى الله عليه وسلم قال لمعاذ: من لقي الله لا يشرك به شيئًا دخل الجنة قال: ألا أبشر الناس قال: لا، أخاف أن يتكلوا

رواه البخارى: 128 ومسلم: 147

අල්ලාහ්ට සමානයන් උපකල්පනය නොකර අල්ලාහ්ව මුණගැසෙන ඕනෑම අයෙකු ස්වර්ගයට ඇතුල් වනු ඇත යනුවෙන් නබි (ﷺ) තුමාණෝ මුආද් තුමාණන්ට ප්‍රකාශ කර සිටි අවස්ථාවේදී මේ ශුභාරංචිය ජනයාට ප්‍රකාශ

කර සිටින්නද යනුවෙන් එතුමා අසා සිටියහ. එසේ ප්‍රකාශ නොකරන්න . මන්ද. ඔවුන් (යහපත් කර්මයන් සිදු නොකොට) මෙයම විශ්වාස කරනු ඇතැයි මා බිය වෙමියි නබි (ﷺ) තුමාණන් විසින් එවිට ප්‍රකාශ කරන ලදී. (බුහාරි 128, මුස්ලිම්: 147) වාර්තාකරුː අනස් (رضي الله عنه) තුමා.

عن ابن مسعود رضي الله عنه قال : ما أنت بمحدث قوما حديثا لا تبلغهم عقولهم إلا كان لبعضهم فتنة رواه مسلم :14

ඔබ සිත්හි ධාරණය කළ නොහැකි ප්‍රකාශයක් යම් සමාජයක් අබියස නිකුත් කළේ නම් එම ප්‍රකාශය ඔවුන්ගේ ඇතැමුන් හට අර්බුධකාරී තත්ත්වයක් ඇති කරනු ඇත යනුවෙන් ඉබ්නු මස්ඌද් (رضي الله عنه) තුමාණන් විසින් වාර්තා කරන ලදී. (මුස්ලිම්: 14)

කෙටියෙන් කිවහොත්, අලි (رضي الله عنه) තුමාණන්, තේරුම් ගැනීමට හැකි කරුණු මිනිසුනට උගන්වන්න යන කියමනින් අදහස් කළේ සවන් දෙන්නන්ගේ චින්තන ශක්තිය ගැන සැලැකලිමත් විය යුතු බව මිස අද්වෛතයේ ප්‍රඥාව ගැන නොවේ.

